# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2311/39 - 2022 දෙසැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර මුදල් පනත

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර මුදල් පනතේ 43 වැනි වගන්තියෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙත සතු කරන ලද බලතල ප්‍රකාරව ඒ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1981 ජනවාරි 23 දිනැති රජයේ ගැසට් අංක 125 හි පළ කරන ලද සේවා නියුක්තයන්ගේ භාර මුදල් නියෝග මෙයින් පහත පරිදි සංශෝධනය කෙරේ :-

3. (1) (ආ) නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන නව නියෝග ඇතුළත් කරනු ලබන අතර ඒවා 3. (1)(ඇ) සහ (ඈ) ලෙස බලාත්මක විය යුතුය.

"(ඇ) අවම වශයෙන් සේවා නියුක්තියන් පහළොවක් තම සේවයේ නියුක්තව සිටින සෑම සේවා යෝජකයකු විසින්ම, 2023 පෙබරවාරි 01 වැනි දින සිට, පරිගණක පද්ධතියක් හෝ ජංගම ඉලෙක්ට්‍රෝනික උපාංගයක් හරහා ඉලෙක්ට්‍රෝනිකව දායකත්ව මුදල් ප්‍රේෂණය කළ යුතුය.

(ඈ) අවම වශයෙන් සේවානියුක්තියන් පහළොවක් තම සේවයේ නියුක්තව සිටින සෑම සේවා යෝජකයකු විසින්ම ඉලෙක්ට්‍රෝනික මාර්ගයෙන් මණ්ඩලය වෙත මාසිකව වාර්තා ඉදිරිපත් කල යුතුය. මෙම නියෝගය 2023 පෙබරවාරි 01 වැනි දින සිට බලාත්මක වේ."

EOG 12 - 0284


1A - PG 6115 — 506 (2022/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.